SJSD 2023 1(1): 44 - 59

**SRI LANKA JOURNAL OF SOCIAL DEVELOPEMENT** (SJSD)
**Volume 03 – Issue 01**

DOI: https://doi.org/10.4038/sljsd.v3i1.10

# කාන්තාවන් සවිබලගැන්වීමෙහිලා ප්‍රජා සංවර්ධන වැඩසටහන්හි දායකත්වය පිළිබඳ සමාජවිද්‍යාත්මක විමසුමක්

# A sociological survey on the contribution of community development programs in empowering women

**Balasooriya V.P.S.S.**[1],
[1] Department of Sociology, University of Sri Jayewardenepura,

**Piumali K.D.**[2],
[1] Sri Lanka National Cooperative Council, Colombo,

## Abstract

Due to gender-based societal constructs, women face various challenging conditions within society. Empowering women is essential to minimize these adverse conditions and improve their living standards while ensuring they receive appropriate recognition in society. Therefore, the research problem explored here is to what extent current community development programs aimed at empowering women are effective. The primary objective of this study is to identify the usefulness of community development programs in the empowerment of women.

Other specific objectives of the study include: understanding the nature of community development programs implemented for women's empowerment; identifying women's roles in society by recognizing their identity; analyzing the impact of community development programs on the social status of women; examining the influence of these programs on the economic condition of families; and identifying the success and failure of such programs.

To achieve the research objectives, a qualitative methodology was adopted, and qualitative data were used. The study includes an analysis of both

secondary data obtained from previous research on community development projects and primary data collected through interview methods.

Among the women participating in these programs, the majority were middle-aged, between 35 and 50 years old. The research identified several issues, including insufficient awareness about gender-based violence and related legal frameworks, women earning income but still experiencing a marginal position within the household, outdated community development programs, inadequate government funding, and the inactivity of certain women’s organizations. Despite economic empowerment, the study found that women's social empowerment remained at a minimal level.

The research highlights the need for programs that not only focus on economic empowerment but also address social empowerment. Strategic approaches such as raising political awareness, educating women on gender-based violence and women's rights, increasing government funding, and updating the programs to align with contemporary needs can enhance the effectiveness of community development programs in empowering women.

**Keywords**: Women, Empowerment, Women’s Organizations, Community Development Programs

## හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියේ සන්දර්භය තුළ බලගැන්වීම යනු ඉතා ජනප්‍රිය යෙදුමකි. සමාජයේ ප්‍රධාන මෙවලම කාන්තාව වන අතර ඔවුන්ගේ දියුණුව ලෝකයේ සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ. එම නිසාවෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන් සවිබලගැන්වීම ඉතා වැදගත් කොට සලකයි. කාන්තාවන් සවිබලගැන්වීම යන්නෙන් අදහස් කරන්නේ කාන්තාවන්ට නොනැසී පැවතීම සහ ඔවුන්ට ගෞරවය, ආත්ම අභිමානය සහ ආත්ම විශ්වාසයකින් යුත් ජීවිතයක් ගත කිරීමට ඉඩ ලබා දීමයි (Noreen,2011).

Sushma Sahay පෙන්වා දෙන ආකාරයට සවිබලගැන්වීම යනු ක්‍රියාකාරී බහුමාන ක්‍රියාවලියකි. එනම් ජීවිතයේ සෑම අංශයකින්ම කාන්තාවන්ට ඔවුන්ගේ පූර්ණ අනන්‍යතාවය සහ බලය අවබෝධ කර ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශය සපයයි. එයින් විමධ්‍යගතකරණය අදහස් කරයි. එනම් පීඩිත සහ බල රහිත ජනතාව තුළ බලය, අධිකාරිය, රජයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳ තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගී වීම, සංවිධාන මෙන් ම සමාජීය කාරණා සම්බන්ධයෙන් කාන්තාවන් සවිබලගැන්වීම අත්‍යවශ්‍ය කාරණයක් මෙන්ම රටක සර්වකාලීන සංවර්ධනය සඳහා ද අත්‍යවශ්‍ය සාධකයක් වේ.

ඒ අනුව සංවර්ධනය කරා යන ගමන් මග තුළ අනාගත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සදහා ඇති තිරසාර සංවර්ධන අභිමතාර්ථ නැතහොත් ගෝලීය අභිමතාර්ථ සමූහයේ ඇති ප්‍රධාන ඉලක්කයක් වශයෙන් කාන්තාව සවිබලගැන්වීම පෙන්වා දිය හැකිය. එහිදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කරමින් කාන්තාවන්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලන හා පොදු ජීවිතයේ සියලු මට්ටම් වලදී පූර්ණ හා ඵලදායී සහභාගීත්වය හා නායකත්වය සඳහා අවස්ථා තහවුරු කිරීම වැදගත් කොට පෙන්වා දි ඇත(විසුම්පෙරුම, 2015).

ප්‍රජා මනෝ විද්‍යාඥයෙකු වූ Julian Rapport විසින් පෙන්වා දෙන පරිදි සවිබලගැන්වීම මගින් අදහස් කරන්නේ "මිනිසුන්ට සිය ජීවිත පාලනය කර ගැනිමට ඇති හැකියාව වැඩි දියුණු කිරීමයි(විතානගම,2017). එයින් ගම්‍යමාන වන ආකාරයට පුද්ගලයෙකුට සිය ජීවිතය මනා පාලනයකින් ගෙන යා හැකිවන්නේ තම මූලික අවශ්‍යතාවයන් ලගා කර ගැනීමත් සමග ය. කාන්තාව


සවිබලගැන්වීමේ ප්‍රධාන සංරචක 5ක් පිළිබඳව එක්සත් ජාතීන්ගේ නිර්වචනය තුළ අඩංගු කර ඇත. එනම්,

- කාන්තාවන්ගේ ආත්ම වටිනාකම පිළිබඳ හැඟීම
- තේරීම් කිරීමට හා තීරණය කිරීමට
- අවස්ථාවන් සහ සම්පත් වෙත ප්‍රවේශය වීමේ අයිතිය
- නිවස තුළත් ඉන් පිටටත් තම ජීවිතය පාලනය කිරීමට බලය තිබීමේ අයිතිය

වශයෙන් එම සංරචක පෙන්වා දිය හැකිය.

සවිබල ගැන්වීම පිළිබඳ අදහස් දක්වන Keshab Chandra Mandal පෙන්වා දුන්නේ කාන්තා සවිබල ගැන්වීම කාණ්ඩ පහකින් අර්ථ දැක්විය හැකි බවයි. එය පහත රූප සටහන මඟින් පෙන්වා දිය හැකිය.

රූප සටහන් අංක 1.1 කාන්තා සවිබලගැන්වීමේ කාණ්ඩයන්




(මූලාශ්‍රයː පර්යේෂිකාව විසින් සම්පාදිතයි).

තිරසාර හෙටක් සඳහා සවිබල කාන්තාවන් නිර්මාණය කිරීමේ දී ප්‍රජා සංවර්ධනය යන්න ඒ සඳහා වූ තවත් එක් අවස්ථාවකි. සංවර්ධනය යන පුළුල් සංකල්පය තුළ සංවර්ධනය යන්න ආර්ථික විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික හා අධ්‍යාපනික ආදී දෘෂ්ටිකෝණයන්ගෙන් හැදෑරිය හැකි ක්‍රියාවලියක් වශයෙන් පෙන්වා දිය හැකිය. සංවර්ධනය යන්නට වර්ධනය, ප්‍රගතිය, දියුණුව සමග යම් සමීපත්වයක් දක්වයි. සාම්ප්‍රදායික සංවර්ධනය යන්න රටක සුභසාධනය හා ජනතාවගේ ජීවන තත්වය සහ අවස්ථාවන්ගේ වැඩි වීමක් මෙන් ම වාණිජකරණය, කාර්මීකරණය, නවීකරණය හෝ ගෝලීයකරණය හා සම්බන්ධ වූ ක්‍රියාවලියකි. මෙකී

සංවර්ධනය විවිධ අංශ ඔස්සේ අධ්‍යයනය කල හැකි අතර ප්‍රජා සංවර්ධනය යන්න එහි තවත් අංශයක් වේ(විතාරන, 2015).

ප්‍රජා සංවර්ධනය යනු ජනතාව තමාගේම උත්සාහයේ රජයේ අධිකාරීන් සමග ඒකාබද්ධව තම ආර්ථික, සමාජ හා සංස්කෘතික තත්වයන් වර්ධනය කිරීමෙන් ජාතික සංවර්ධනය සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන්නා ක්‍රියාවලියකි. ප්‍රජා සංවර්ධනය මූලික වශයෙන් පදනම් වී ඇත්තේ මානව හිමිකම්, සමාජ සාධරණත්වය, සමානාත්මතාවය සහ විවිධත්වයට ගරු කිරීම යන සාරධර්ම මතය. එහි භාවිතයට පාදක වන මූලධර්ම නම්,

- ස්වයං නිර්ණය - මිනිසුන්ට සහ ප්‍රජාවන්ට තමන්ගේ තේරීම් සහ තීරණ ගැනීමට අයිතියක් ඇත.
- සවිබලගැන්වීම - මිනිසුන්ට තමන්ගේ වත්කම් හා බලපෑම් පාලනය කිරීමට සහ භාවිතා කිරීමට හැකියාවක් තිබිය යුතුය.
- සාමූහික ක්‍රියාකාරීත්වය - කණ්ඩායම් හෝ සංවිධාන එකට එකතු වීම ජනතාව ශක්තිමත් කරයි.
- එකට වැඩ කිරීම සහ ඉගෙනීම - හොඳ ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා සහයෝගීතාව සහ අත්දැකීම් බෙදාගැනීම අත්‍යවශ්‍ය වේ.

තවත් ආකාරයකින් ප්‍රජා සංවර්ධනය යන්න "ජනතාවගේ සහභාගීත්වයෙන් ජනතාවගේ ආරම්භක ශක්තිය උපයෝගී කරගෙන ජනතාවට යහපත් ජීවන තත්වයක් උදාකිරීමට අරමුණු කරගත් ව්‍යාපාරයක්" වශයෙන් හැඳින්විය හැකිය. ජනතාවගේ ආරම්භක ශක්තිය ජනතාව අතරින් නිසැකින්ම ඉස්මතු නොවන්නේ නම් ජනතාව අතර උනන්දුව, ප්‍රබෝධය හා ක්‍රියාකාරීත්වය ඇති කර, එමගින් සංවර්ධනයට යොමු කළ යුතුය.

මේ අනුව පැහැදිලි වන ආකාරයට ප්‍රජා සංවර්ධනය මගින් අවධානය යොමු කරන්නේ ප්‍රජාව සමාජමය, ආර්ථිකමය, දේශපාලනමය, අධ්‍යාපනමය, නීතිමය තත්වයන්ගෙන් ඉහළ මට්ටමකට පැමිණවීමයි. ඒ අනුව ජනයාගේ ජීවන මට්ටම උසස් තත්වයෙන් ගත කිරීමට අවශ්‍ය ආර්ථික සමාජ තත්වයන් ඉහළ නැංවීම සඳහා විවිධ ව්‍යාපෘති වැඩසටහන් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන්හි මූලික අරමුණ වනුයේ කාන්තාවන්ගේ ආර්ථික හා

සමාජීය තත්වය ඉහළ නංවාලීමය. මේ සඳහා ආර්ථික කටයුතු මෙන්ම සමාජීය හා දේශපාලන කටයුතු සම්බන්ධයෙන් ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය වැඩි කරලීම අත්‍යවශ්‍ය වේ. මෙහිදී කාන්තාවන් සම්බන්ධව තොරතුරු එක්රැස් කිරීම, බෙදා හැරීම, කාන්තා සුබසිද්ධිය සඳහා කටයුතු කරන ආයතන අතර සම්බන්ධීකරණය ඇතිකිරීම හා කාන්තා දැනුවත්භාවය වර්ධනය කිරීම, කාන්තාවන්ට ආදායම් මාර්ග සකසා දීම, කාන්තා සංවර්ධන ව්‍යාපාර ආදිය සඳහා විදේශ ආධාර ද, දේශීය මූල්‍ය ආයතන ද, ශිල්ප ක්‍රමද සම්බන්ධ කරගනු ලැබේ(දසනායක,1991 ). මෙහිදී සමාජමය වශයෙන් කාන්තාවන් තුළ ස්ථාවරත්වයක් ඇති කරමින් ඇයගේ අයිතිවාසිකම් හඳුනා ගනිමින් ඇයට එරෙහිවන ප්‍රචණ්ඩ ක්‍රියා වලක්වා ගත හැකිවන අයුරින් මෙන්ම නීතිමය අධ්‍යාපනික වශයෙන් ශක්තිමත් වීමට කාන්තාවන්ට ඉඩහසර ලබා දීම මෙම වැඩසටහන්හි පරමාර්ථය වේ. ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් නගා සිටුවීමට මෙන් ම ඇය සමාජය තුළ සුරක්ෂිත කිරීමෙහි පරමාර්ථයෙන් විවිධ රජයන් යටතේ විවිධ සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්තව ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වනු දැකිය හැකිය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයක් බැවින් ඒ සඳහා දත්ත රැස් කිරීම අරමුණු සහගත නියැදියට අනුව සිදු කරන ලදී. මෙහි දී කාන්තාවන් සවිබලගැන්වීමෙහිලා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන්හි දායකත්වය සම්බන්ධයෙන් දැනට සිදු කර ඇති පර්යේෂණ ආශ්‍රයෙන් ලබා ගත් තොරතුරු විශ්ලේෂණයක් සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තන්තිරිමලේ සහ දෙමටමල්ගොඩ යන ග්‍රාම නිලධාරී වසම්හි තෝරාගත් ප්‍රජා සහභාගීත්ව සංවර්ධන ව්‍යාපෘතීන් දෙකක නිළධාරීන් තිදෙනෙකු බැගින් නිළධාරීන් හයදෙනෙකු සමඟ සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා මඟින් රැස් කර ගනු ලැබූ දත්ත විශ්ලේෂණයක් ද මෙම පර්යේෂණයෙහි ඇතුළත් වේ.

### පූර්ව අධ්‍යයන විශ්ලේෂණ

කාන්තාවන් සවිබලගැන්වීමෙහිලා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන්හි දායකත්වය පිළිබඳව වන මෙම පර්යේෂණය තුළදී න්‍යායාත්මක හා ආනුභවික සාහිත්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් ද පරිශීලනය කිරීමක් සිදු කරන ලදී.

2013 වර්ෂයේ රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යනාංශයේ කථිකාචාර්ය උපාලි පන්නිලගේ විසින් Participation of Villagers in Governing Rural

Development යනුවෙන් පර්යේෂණයක් සිදු කර ඇති අතර මෙහි අරමුණ වුයේ ග්‍රාමීය සංවර්ධනය සිදු කිරීමේදී තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට ගම්වැසියන් සහභාගී වන අයුරු අධ්‍යයනය කිරීම හා එහි දුර්වලතාවයන් පෙන්වා දෙමින් ඒ සඳහා විසඳුම් යෝජනා කිරීමයි. මෙම පර්යේෂණය තුළ ග්‍රාමීය සංවර්ධනය, ප්‍රජා සහභාගීත්වය, සංවර්ධන ක්‍රමෝපායන්, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳව අවධානය යොමු කර තිබේ. එය ග්‍රාම සංවර්ධන ක්‍රියාවලිය තුළ මැනවින් සිදු වන්නේද යන්න මෙම අධ්‍යයනය මගින් අනාවරණය කරයි(Pannilage, 2013).

2012 වසරේ Louiciana විශ්වවිද්‍යාලයේ Emmanuel Jangan Johnson jsiska Community Participation in India – A major innovative tool of success in community level programmes යනුවෙන් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ ඉන්දයාවේ බිම් මට්ටමේ වැඩසටහන් සඳහා ප්‍රජා සහභාගීත්වය දායක වන ආකාරය පිළිබද විශ්ලේෂණය කිරීම වේ. ඍකියා පරිසර අභියෝග, ග්‍රාමීය පසුබිම් වල සමාජ සේවාවන්ට ඇති අභියෝග, ප්‍රජා සහභාගීත්වයේ අභියෝග, ප්‍රජා සවිබලගැන්වීමේ අභියෝග හා එම අභියෝග සදහා මුදුන්පමුණුවා ගැනීම සදහා තීරණ ගැනීමේ දී සහ සේවා සැපයීමේ දී මහජන සහභාගීත්වය ඉහළ නංවා ගැනීම, සේවා කාර්ය සාධනය වැඩිදියුණු කිරීම පිළිබදව ආමන්ත්‍රණය කරයි. මෙම අභියෝග සදහා මුහුණ දීමට ප්‍රජා සංවර්ධන කාර්යයේ විභව දායකත්වය ගවේෂණය කරයි(Johnson, 2012).

Amzat විසින් Women's empowerment and its effect on community development in Oman නම් මෙම අධ්‍යයනයෙන් ඕමාන් සමාජයේ කාන්තා සවිබලගැන්වීම රජයේ විශ්වවිද්‍යාල තුනක කාන්තා විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන්ගේ දෘෂ්ඨි කෝණයෙන් අධ්‍යාපන අවස්ථා, සේවා නියුක්තියේ සමානාත්මතාවය සහ ප්‍රජාව තුළ ඔවුන්ගේ සමාජ තත්ත්වය පිළිබඳව විමර්ශණය කරයි. විශ්වවිද්‍යාල කාන්තාවන්ගේ හැඟිම් සහ ඕමානයේ කාන්තාවන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සලකා බැලිය යුතු සාධක මත පදනම්ව කාන්තාවන් සවිබලගැන්විය හැකි ආකාර පිළිබඳ අධ්‍යයනයක් මෙම අධ්‍යයනයෙන් යෝජනා කරයි. අදාල සාධක සහ කාන්තාවන්ගේ සංවර්ධනයට ඒවා බලපාන ආකාරය තීරණය කිරීම සඳහා ස්ථිර සාධක විශ්ලේෂණය සහ මාර්ග විශ්ලේෂණය භාවිතා කරමින් සමාජ හා

ප්‍රජා භාවිතයන් සඳහා දර්ශකයන් මෙම ආකෘතිය සපයයි. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල මඟින් ප්‍රජා සංවර්ධනය කෙරෙහි ඕමානයේ කාන්තාවන් සවිබලගැන්වීම කෙරෙහි ඍජු බලපෑමක් පෙන්නුම් කරන ලදී. මෙම අධ්‍යයනය මඟින් යෝජනා කරන්නේ සෑම අංශයක් කෙරෙහිම කාන්තාවන් බඳවා ගැනීම, කාන්තාවන්ට වැඩි රැකියා අවස්ථා නිර්මාණය කිරීම, කාන්තා නායකත්වය දිරිමත් කිරීම සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා පිළිබඳ අතිරේක අධ්‍යාපනය ලබා දීම යන කාරණයන් අනාවරණය කරයි(Amzat, 2017).

Basaleem (2016) විසින් සිදු කරන ලද Community development through Women Empowerment and Utilization of Literacy and Vocational skills services of an Educational Project යන ලිපිය මඟින් කාන්තා සවිබලගැන්වීම සඳහා අවම වශයෙන් මානයන් තුනක් ඇතුලත් වන බව පෙන්වා දෙයි. එනම් අධ්‍යාපනික, ආර්ථික හා නෛතික යන මානයන්ය. මෙම මානයන් ප්‍රජා සංවර්ධනය සමඟ දැඩි ලෙස සම්බන්ධ වේ. ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය කාන්තා සමාජ හා සෞඛ්‍ය තත්ත්වය සහ ඉලක්ක ගත සේවාවන් භාවිතා කිරීම පිළිබඳ ප්‍රජා අවබෝධය ග්‍රාමීය සමාජයන්හි කාන්තා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියට උදාහරණයක් ලෙස ගුණාත්මකව විස්තර කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙම අධ්‍යයනයට අදාළ දත්ත ලබා ගැනීම උදෙසා විවිධ ප්‍රජා අංශවල කාන්තාවන් සහ පිරිමින් 15 ක් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී(Basaleem,2016).

Bashir විසින් සිදු කරන ලද Women Empowerment through community Development programs in Baluchistan නම් මෙම පර්යේෂණ අධ්‍යයනය බලුකිස්තානයේ ප්‍රජා සංවර්ධන වැඩසටහන් මගින් කාන්තා සවිබලගැන්වීම විමර්ශනය කරයි. දිස්ත්‍රික්කයේ ෂිර්කාත්ගා කාන්තා සම්පත් මධ්‍යස්ථානය විසින් දියත් කරන ලද "මුස්ලිම් සන්දර්භය තුළ කාන්තා සවිබලගැන්වීම, ස්ත්‍රී පුරුෂභාවය, දරිද්‍රතාවය සහ ප්‍රජාතන්ත්‍රීයකරණය" යන ප්‍රජා සංවර්ධන වැඩසටහනක බලපෑම අනාවරණය කර ගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවල කාන්තා ප්‍රතිලාභීන් සමඟ සම්මුඛ සාකච්ඡා හා ක්ෂේත්‍ර අධ්‍යයන ඇතුළත් වේ(Bashir, 2017).

ඉහත සඳහන් පර්යේෂණ මඟින් ද පැහැදිලි වනුයේ විවිධ රටවල්වල කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා මෙම ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන බවයි. එමඟින් කාන්තාවන් විවිධ අංශයන්ගෙන් සවිබලගැන්වීමක් වන බව පෙන්වා දිය


හැකිය. කාන්තාව ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා බහුවිධ වැඩසටහන් ක්‍රියාත්මක වී ඇති බව මෙහි දී පෙන්වා දිය හැකිය.

## සාකච්ඡා (Discussion)

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තන්තිරිමලේ සහ දෙමටමල්ගොඩ යන ග්‍රාම නිලධාරී වසම්හි තෝරාගත් ප්‍රජා සහභාගීත්ව සංවර්ධන ව්‍යාපෘතීන් දෙකෙහි නිළධාරීන් තිදෙනෙකු බැගින් නිළධාරීන් හයදෙනෙකු සමග සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා මඟින් තහවුරු කර ගත් තොරතුරු මත මෙම විශ්ලේෂණය කර ඇත.

ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා කාන්තා සහභාගීත්වය පිළිබඳව විමසා බැලීමේදී කාන්තාවන් ඒ සඳහා වැඩි සහභාගීත්වයක් පෙන්වන අතර එය කාන්තාවන් සවිබලගැන්වීමෙහිලා සාර්ථක ප්‍රවණතාවයක් ලෙස පෙන්වා දිය හැකි බව නිළධාරීන්ගේ අදහස විය. එමෙන්ම මෙම වැඩසටහන් සඳහා සහභාගී නොවන්නන් ඉතා අවම ප්‍රමාණයක් බවත් මොවුන්ගේ අදහස විය. එය පහත ප්‍රස්තාරයෙහි දැක්වෙන් පරිදි පෙන්වා දිය හැකිය.

ප්‍රස්තාර අංක 01- ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා කාන්තාවන්ගේ දායකත්වය




(මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

ප්‍රජා සංවිධාන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් පිළිබඳව නිළධාරීන්ගෙන් විමසා බැලීමේ දී විශේෂයෙන් කාන්තා සමිති මඟින් ශිල්පීය පුහුණු වැඩසටහන් වැඩි වශයෙන් ක්‍රියාත්මක කරන බව පැහැදිලි විය. ණය මුදල් ලබා දීමේ වැඩසටහන්, ආර්ථික සංවර්ධන වැඩසටහන්, සෞඛ්‍ය හා පෝෂණය නඟා සිටුවීමේ වැඩසටහන් , ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්, ඉතිරි කිරීම පිළිබඳ වැඩසටහන, වගාවන් පිළිබඳ වැඩසටහන් හා ව්‍යවසායකත්ව වැඩසටහන් ද ක්‍රියාත්මක වන බව අනාවරණය විය. කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීමෙහිලා ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා වැඩි වශයෙන් සහභාගී වන බවත් සමාජීය වශයෙන් දැනුවත් වීමේ වැඩසටහන් සඳහා අඩු වශයෙන් කාන්තාවන් සහභාගී වීමක් පෙන්නුම් කරන බවත් පැවසීය. නමුත් දේශපාලන සහභාගීත්ව ප්‍රවර්ධන වැඩසටහන් ඉතා අඩු ප්‍රමාණයකින් ක්‍රියාත්මක වන බවත් ඒ සඳහා කාන්තාවන්ගේ අඩු සහභාගීත්වයක් පෙන්නුම් කරන බවත් අධ්‍යයනය මගින් සනාථ විය.

කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ අපේක්ෂාව පෙරදැරි කර ගනිමින් මෙම ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන අතර මෙම වැඩසටහන් සඳහා සහභාගී වීමෙන් අනතුරුව කාන්තාවන්ගේ ආර්ථිකයෙහි යම් වෙනසක් සිදු වී ඇත්නම් ඒ කෙසේ ද යන්න පිළිබඳවත් නිළධාරීන්ගෙන් විමසීය. ඒ පිළිබඳව ඉදිරිපත් වු අදහස් පහත වගු සටහන ආශ්‍රිතව පෙන්වා දිය හැකිය.

වගු අංක 02: ප්‍රජා සංවර්ධන වැඩසටහන් තුළින් කාන්තාවන්ට ලැබුණු ප්‍රතිලාභ

| **ලැබු ප්‍රතිලාභ පිළිබඳ විස්තර** | **ප්‍රතිශතය (%)** |
|---|---|
| ස්වයං රැකියාවක් පිළිබඳ අවබෝධය ලැබීම | 32.5 |
| ණය පහසුකම් ලබා ගැනීමට හැකි වීම | 24.4 |
| රැකියා අවස්ථාවන් හිමි වීම | 8.8 |
| වෙළඳපොළ අවස්ථාවන් හිමිවීම | 17.5 |
| ස්වයං රැකියා සඳහා අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට හැකි වීම | 12.5 |
| නිළධාරින්ගේ සහය ලබා ගැනීමට හැකි වීම | 4.4 |
| **එකතුව** | **100** |

(මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් වූ ආකාර පිළිබඳව කරුණු සොයා බැලීමේ දී පහත කරුණු අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි. ඒ අනුව කාන්තාවන්ට මෙම වැඩසටහන් ඇසුරින් ස්වයං රැකියා පිළිබඳව දැන ගැනීමට හැකි වීමත් සමග ඔවුන් ස්වයං රැකියාවන් සඳහා යොමු වීම තුළින් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් වී ඇති බව 60% ක් වැනි පිරිසක් පෙන්වා දී ඇත. ණය පහසුකම් ලබාදීම හරහා කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් වී ඇති බව 24%ක රැකියා අවස්ථාවන් හිමිවීම තුළ කාන්තාවන් 9%ක වෙළඳපොළ අවස්ථාවන් හිමි වීම තුළ 18%ක ස්වයං රැකියා සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම තුළ 13% ක වෙනත් නිළධාරීන්ගේ සහය ලබා ගනිමින් තම ආර්ථිකය ශක්තිමත් කර ගත් කාන්තාවන් 4% ක් වශයෙන් මෙහිදී හඳුනා ගත හැකි විය. ඒ අනුව කාන්තාවන්ට ආර්ථිකමය වශයෙන් කිසියම් වූ වර්ධනයක් අත්පත් කර ගැනීමට මෙම ප්‍රජා සංවර්ධන වැඩසටහන් යම්තාක් දුරකට දායක වී ඇති බව මෙයින් පැහැදිලි වේ. එහිදී පැහැදිලි වන ආකාරයට අතීතයට සාපේක්ෂව රටක ආර්ථිකයට කාන්තාවන්ගේ දායකත්වයෙහි ඇති වැදගත්කම සහ ඒ සඳහා වන උනන්දුව පැසසිය යුතු මට්ටමකින් වර්ධනය වී ඇත.

කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රජා සංවර්ධන වැඩසටහන්හි සංවර්ධන විය යුතු අංගයන් පිළිබඳව නිළධාරීන්ගෙන්ම අදහස් විමසීමක් සිදු කළ අතර ඒ සඳහා ඔවුන් ලබා දුන් පිළිතුරු පහත පරිදි පෙන්වා දිය හැකිය.

වගු අංක 03 ප්‍රජා සංවර්ධන වැඩසටහන්හි සංවර්ධන විය යුතු අංගයන් පිළිබඳ විස්තර

| **සංවර්ධනය විය යුතු අංගයන්** | **ප්‍රතිශතය(%)** |
|---|---|
| කාන්තාවන්ට අවශ්‍ය ස්වයං රැකියා උපකරණ ලබා දීම | 14 |
| නව වැඩසටහන් හඳුන්වා දීම | 20 |
| රජයෙන් ලැබෙන ප්‍රතිපාදන වැඩි කිරීම | 14. |
| නිළධාරීන්ගේ මැදිහත්වීම වැඩිවිය යුතු බව | 15 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි කිරීම | 18 |

| | |
|---|---|
| තාක්ෂණය පිළිබඳ නව දැනුම ලබා දීම | 12. |
| කාන්තා සමිති සක්‍රීයව පවත්වාගෙන යාම | 7. |
| **එකතුව** | **100** |

(මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

මෙම ප්‍රජා සංවර්ධන වැඩසටහන් තුළ සංවර්ධනය විය යුතු අංගයන් පිළිබඳව විවිධ අදහස් නිළධාරීන්ගෙන් ලැබුණි. ඒ අතරින් වැඩි පිරිසකගේ අදහස වී තිබුණේ නව වැඩසටහන් හඳුන්වා දිය යුතු බවත් දැනුවත් කිරීමේ වැඩසටහන් තව දුරටත් ක්‍රියාත්මක විය යුතු බවත් ය. මෙහි සංවර්ධනය විය යුතු තවත් අංගයක් ලෙස පෙන්වා දී ඇත්තේ කාන්තාවන්ට තාක්ෂණය පිළිබඳව නව දැනුම ලබා දිය යුතු බවයි. දියුණු වෙමින් පවතින සමාජ ක්‍රමයත් සමඟින් කාන්තාව තාක්ෂණික වශයෙන් ද සවිබලගැන්වීමේ අවශ්‍යතාව වර්ධනය වෙමින් පවතින බව මෙහිදී අනාවරණය කර ගත හැකි විය. එසේම ප්‍රජා සංවිධාන මගින් ක්‍රියාත්මක වන කාන්තා සමිති සක්‍රීයව පවත්වාගෙන යා යුතු බවත් නිළධාරීන්ගේ අදහස විය. මේ අනුව පැහැදිලි වන්නේ ප්‍රජා සංවිධාන මගින් බහුවිධ ප්‍රතිලාභ ප්‍රජාව විසින් බලාපොරොත්තු වන බවත් ඒවා කෙරෙහි රජයේ අවධානය යොමු වීම වැදගත් වන බවත්ය.

**සොයා ගැනීම්**

- කාන්තාවන් සවිබලගැන්වීමෙහි ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන්හි දායකත්වය පිළිබඳ සිදු කරන ලද මෙම අධ්‍යයනයේ දී විවිධ වූ සාධක කෙරෙහි අවධානය යොමු කිරීමට හැකියාව ලැබුණි. එහි දී තහවුරු කර ගත් කරුණු පහත පරිදි දැක්විය හැකිය.

- ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා දායක වන කාන්තාවන් අතරින් වැඩි පිරිසක් මැදි වියේ පසුවන කාන්තාවන් බව මෙම අධ්‍යයනය තුළින් නිගමනය විය.

- කාන්තාවන්ගෙන් වැඩි පිරිසකගේ පවුලේ මාසික ආදායම් මට්ටම අවම ආදායම් මට්ටමක් වූ නිසාවෙන් කාන්තාවන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වීමට මෙම ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වන බව නිළධාරීන්ගේ අදහස විය.

- ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වන අරමුණු සලකා බැලීමේදී බොහෝමයක් කාන්තාවන් ස්වයං රැකියා සඳහා වූ ශිල්පීය පුහුණුවීම් ලබා ගැනීමටත්, ආර්ථිකමය වර්ධනයන් හා ණය ලබා ගැනීමේ අරමුණින් සහභාගී වී ඇති බවත් පැහැදිලිව හඳුනා ගත හැකි විය. එයින් නිගමනය කළ හැකි වන්නේ කාන්තාවන් වැඩි පිරිසක් ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීම අරමුණු කර ගනිමින් මේ වැඩසටහන් සඳහා සහභාගි වී ඇති බවය.
- කාන්තාවන් සවිබලගැන්වීමෙහි ලා කාන්තා සමිති හරහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් අතරින් බොහෝමයක් වැඩසටහන් ආර්ථිකය අරමුණු කර ගෙන සංවිධානය කර ඇති බව නිගමනය වූ අතර කාන්තාවන්ගේ සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා සංවිධානය කර ඇති වැඩසටහන් අවම බවද නිගමනය කළ හැකිය.
- මෙම වැඩසටහන් සඳහා සහභාගී වූ කාන්තාවන් අතරින් බහුතරයක් මේ හරහා ස්වයං රැකියාවක් පිළිබඳ දැනුවත්වී ඇති බවත් එම නිසා බොහෝ දෙනෙක් ස්වයං රැකියා ආශ්‍රිතව තම රැකියාවන් සිදු කරගෙන යන බවත් තවහුරු විය.
- නමුත් වැඩසටහන් සඳහා සහභාගීවන කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය ප්‍රමාණවත් නොවන බව නිගමනය වූ අතර කාන්තාවන්ගේ පවතින නොදැනුවත් බව, පවුල් පසුබිම හා සමාජ ආකල්ප දේශපාලනයට පිවිසීමට ඇති බාධාවන් ලෙස නිළධාරීන් හඳුනා ගෙන ඇති බව අනාවරණය විය.

**යෝජනා**

කාන්තාවන් සවිබලගැන්වීමෙහි ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන්හි දායකත්වය පිළිබඳ සිදු කරන ලද මෙම අධ්‍යයනයේ දී විවිධ වු සාධක කෙරෙහි අවධානය යොමු කිරීමට හැකියාව ලැබුණි. එහි දී හඳුනා ගනු ලැබු කරුණු සඳහා යෝජනා ඉදිරිපත් කිරීමක් ද මෙහිදී සිදු කරනු ලැබේ.

කාන්තාවන් ආර්ථික වශයෙන් පමණක් නොව සමාජීය වශයෙන්ද සවිබලගැන්වීම සිදු කළ යුතුය. එහිදී සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම කළ යුතුය. ඒ සඳහා ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වය හා නියෝජනය වර්ධනය කිරීමේ වැඩසටහන් දියත් කිරීම මෙන්ම එම

වැඩසටහන් තුළදී දේශපාලනය පිළිබඳ ස්ත්‍රීන් දැනුවත් කිරීම පිළිබඳ පුහුණු ලබා දීම සඳහා මාධ්‍ය වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාවයක් පවතී. මෙහි දී මාධ්‍ය මඟින් විශාල කාර්යයක් සිදු කිරීමේ හැකියාව පවතිනු ඇත.

එසේම කාන්තාවන් සමාජය තුළදී මුහුණ දෙන ගැටලු අවම කිරීමෙහිලා කාන්තාවන් හා සම්බන්ධව පවතින නීති, අයිතිවාසිකම් පිළිබඳ නිරන්තරයෙන් ඔවුන් දැනුවත් කිරීම කළ යුතුය. ඒ සඳහා විවිධ වැඩසටහන් දියත් කිරීමේ හැකියාව පවතී. එසේම කාන්තාව ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා කාන්තාවන්ට ස්වයං රැකියාවන් පිළිබඳ  අදහස ලබාදීම පමණක් නොව ඇයට උචිත වෙළඳපොළක් තෝරා ගැනීමට අදාළ උපදෙස් ලබාදීම ද මෙහිදී කළ යුතුය. කාන්තාවන්ට රැකියාමය අවස්ථාවන් වෙත ලඟා වීම සඳහා වූ තොරතුරු ලබා ගැනීමට ඒ සඳහා දැනුම ඇති නිළධාරින් හඳුන්වා දීම තුළ ඔවුන් ඒ පිළිබඳ දැනුමෙන් පරිපූර්ණ වනු ඇත. කාන්තාවන්ගේ රැකියාමය අවස්ථාවන්ට අවශ්‍ය උපකරණ ලබා දීමට හා ඒවා ලබා ගැනීමට රජය දක්වන දායකත්වය වැඩි කිරීම තුළ කාන්තා ශ්‍රම දායකත්වය රටේ ආර්ථික වර්ධනයට ධනාත්මක බලපෑමක් වේ.

විශේෂයෙන් දියුණුවන සමාජයත් සමග කාන්තාවන්ට අවශ්‍ය නව තාක්ෂණික දැනුම භාවිතා කිරීම පිළිබඳ වැඩසටහන් සිදු කිරීම මගින් ඔවුන් තාක්ෂණික වශයෙන් සවිබලගැන්වීමක් ද සිදු කළ හැකිය. පුහුණු අවශ්‍යතා පවතින කාන්තාවන් සඳහා නව තාක්ෂණික පුහුණුවීම් ලබා දීම තුළ ඔවුන්ට නව රැකියාමය අවස්ථාවන්ට මග විවරණය කිරීම, මෙම වැඩසටහන් පිළිබඳ නොදැනුවත් කාන්තාවන් දැනුවත් කිරීම මගින් සමාජයේ ආන්තීකරණය වී සිටින කාන්තාවන්ට සමාජ වරප්‍රසාද ලබා ගැනීමට අවස්ථාවක් වනු ඇත. එසේම වැඩසටහන් සක්‍රීයව පවත්වාගෙන යාමට අදාළ නිළධාරින් විසින් වගකීම ගත යුතු අතර විධිමත් ක්‍රියා පටිපාටියකට අනුව අදාළ වැඩසටහන් පවත්වා ගෙන යාම වැදගත් වේ. කාන්තාවන් සවිබලගැන්වීම විවිධ කලාපයක් අතුරින් ඇගේ නියෝජිතත්වය පුළුල් කිරීම කෙරෙහි ධනාත්මක බලපෑම  සිදු කරන්නේ ආර්ථික සවිබලගැන්වීමයි. ආර්ථික සම්පත් හා අවස්ථා කෙරෙහි වැඩි ප්‍රවේශයක් ලබා දීම මෙන්ම විධිමත් ශ්‍රම වෙළෙඳපොළ තුළ ස්ත්‍රී පුරුෂ පක්ෂපාතීත්වය ඉවත් කිරීම වනා හී කාන්තාවන් ආර්ථික සවිබලගැන්වීම අත්පත් කර ගැනීම සඳහා මූලිකාංග වේ. ආර්ථික සවිබලගැන්වීම යනු මෙකී අවස්ථාවන් ආදායම ඉපයීම සඳහා භාවිතා කිරීම පමණක් නොව සමාජයේ අවිධිමත් හා විධිමත් යාන්ත්‍රණයන් තුළ පවත්නා ස්ත්‍රී පුරුෂ අසමානතා අවම කිරීමට එකී මූල්‍ය ස්වාධීනත්වය භාවිතා

කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳවද සාකච්ජා කිරීමකි. මෙම ව්‍යාපෘතීන් මගින් හෝ එම ක්‍රියාවලිය පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීම සිදු කළ යුතුව ඇත.

කාන්තාවන් සවිබලගැන්වීම කෙරෙහි අධ්‍යාපනය කේන්ද්‍රිය වේ. තෝරා ගැනීමේ නිදහස සඳහා විවිධ අයුරින් දායක වීම නිසා අධ්‍යාපනය කාන්තාවන්ගේ ආර්ථික පමණක් නොව සමස්ත සවිබලගැන්වීම කෙරෙහි ද මඟ පෙන්වයි. එසේම සිය ජීවිත කෙරෙහි බලපාන තීරණ ගැනීමේ දී ස්වාධීනව ක්‍රියා කිරීමට කාන්තාවන්ට ඇති හැකියාවට බලපෑම් කිරීම සඳහා ප්‍රාථමික මට්ටමින් ඉහළ අධ්‍යාපනයක් ලැබීම වැදගත් බව ද මෙම ව්‍යාපෘති හරහා දැනුවත් කිරීමට හැකියාව පවතී. ගැහැණු ළමුන් අධ්‍යාපනයට ඇති ප්‍රවේශය සම්බන්ධයෙන් ප්‍රගතියක් දක්නට ලැබුණ ද සම්පත් සඳහා විශේෂයෙන් ඉඩම් සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය තුළ සැලකිය යුතු අසමානතා තවදුරටත් දක්නට ලැබේ. ඉඩම් අයිතිය කාන්තාවන් සවිබලගැන්වීම කෙරෙහි තීරණාත්මක සාධකයක් ලෙස හඳුනා ගැනේ. මෙම කරුණු සම්බන්ධයෙන් කාන්තාවන් දැනුවත් කිරීමක් මෙම ව්‍යාපෘතින් මගින් සිදු වන බවත් එය සක්‍රීයව ක්‍රියාත්මක කිරීම අවශ්‍යතාවයක් වී ඇති බවත් නිගමනය කළ හැකිවේ.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


දසනායක. එල්. (1992). *ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා එහි කටයුතු.* කාන්තා සවිය. බත්තරමුල්ලඃ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය.

විතානගම, ආර්. (2017). *කාන්තාවන් ආර්ථිකව සවිබල ගැන්වීම.* කොළඹඃ ජනවාර්ගික අධ්‍යයනය පිළිබද ජාත්‍යන්තර කේන්ද්‍රය.

විතාරන. එල්. ඩී. (2015). *සංවර්ධනයඃසංකල්පීය ගොඩනැගීම සහ ක්‍රියාකාරීත්වය* 71(1),36- repository.kln.ac.lk/handle/123456789/12050(Accessed 05 April 2023).

විදුසම්පෙරුම. ඩී. (2015). ලෝකයේ අනාගත සංවර්ධනයේ තිරසාර සංවර්ධන අභිමථාර්ථ. http://www.vidusara.com ((Accessed 08 April 2023).)

සමරවීර, ඩබ්. (1999). ශ්‍රී ලාංකික කාන්තාවනගේ ආර්ථික මෙහෙවර හා වෙළඳ කලාප යුවතියෝ. *කාන්තා සවිය.* කොළඹ 05ඃවනිතා කටයුතු අමාත්‍යංශය.

Amzat, I. H. (2017). Women’s empowerment and its effect on community development in
Oman; Predictive model and indicators for best practices. Community work and Family, 22 (3), 338-356

Basaleem, H. (2016). Community development through Women Empowerment and tilization of Literacy and Vocational skills services of an Educational Project Khammer, amran Yeman. Journal of Research in International Education, 2 (1), 127-134

Bashir, S (2017). Women Empowerment through community Development programs in Baluchistan. Baluchistan Review, 37(2)78https://www.researchgate.net/ publication/ 327884513_Women_empowerment_through_co mmunity_ Development_ programs_in_ Balochistan

Johnson. E.J. (2011). Community Participation in India -A major innovative tool of successin Community Level Programmes. https://www.researchgate.net/publication/233741563_

Community_Participation_in_India_major_innovative_tool_of_success_in_Community_Level_Programmes

Pannilage. U. (2013). Participation of Villagers in Governing Rural Development. International Symposium on Community Goverance Practice. https://www.researchgate.net/publication/283726636_Participation_of_Villagers_in_Governing_Rural_Development

Noreen, S. (2011). Role of Microfinance in empowerment of Female Population. International Conference on economics and Finance Research, Singapore. Abstract. http://www.ipedr.com/vo14/16-F10057